CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

No 17A, Pedris Road, Colombo 3, Tel: **011 3010662-4**, Fax: **011 2577117**
**E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

## පාර්ලිමේන්තු මහ මැතිවරණය 2015

## මාධ්‍ය නිවේදනය 08

**2015 අගෝස්තු 16 වන දින ශ්‍රී ලංකාව, කොළඹ**

**2015 අගෝස්තු 16 - ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම ඡන්ද කොට්ඨාසයේ, නෙළුවේ ඝාතනය**

2015 අගෝස්තු 16 වෙනි දින පෙ. ව. 7.00 පමණ ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම ඡන්ද කොට්ඨාසයේ, නෙළුව ප්‍රදේශයේ ලේවැල්ලෙදී ඝාතනය කරන ලද්දකුගේ සිරුරක් සොයා ගනු ලැබ තිබෙන බව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට වාර්තා වී ඇත. වර්තාවට අනුව ඝාතනයට ලක් වූ පුද්ගලයා ගාලු දිස්ත්‍රික් එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂක පියසේන ගමගේ මහතාට සහයෝගය පක්ෂ කාර්යාලයක් පවත්වා ගෙන ගිය එජනිස ආධාරකරුවෙකු වන 63 වියැති චන්ද්‍රදාස වික්‍රමාරච්චි නම් පුද්ගලයා වශයෙන් හඳුනා ගෙන තිබේ.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය චන්ද්‍රදාස මහතාගේ සහෝදරයා වන ගුණපාල වික්‍රමසිංහ මහතාගෙන් විමසූ විට මේ සම්බන්ධයෙන් කිසිවෙකු සැක කිරීමට ඔහුට නොහැකි බව දැනුම් දුන් අතර දරු දෙදෙනෙකුගේ පියෙකු වූ ඝාතනයට පත් සිය සහෝදරයාට ඔහුගේ පෞද්ගලික ජීවිතයේ දී කිසිදු සතුරෙකු නොසිටි බව ද තවදුරටත් පැවසීය.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය ගාලු දිස්ත්‍රික් එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂක පියසේන ගමගේ මහතාගෙන් මේ පිළිබඳව විමසූ විට ඔහු පැවසුවේ ඝාතනයට පත් තැනැත්තා තමාගේ ප්‍රධාන ආධාරකරුවෙකු බවත් මේ කාරණය සම්බන්ධයෙන් තමන් කිසිවෙකු සැක කර නොමැති බවත් ය.

නෙළුව ප්‍රාදේශීය සභා උප සභාපති පියරත්න ගමගේ මහතාගෙන් විමසූ විට ඔහු සඳහන් කළේ මෙම සිද්ධිය පිළිබඳව විස්තරයක් කිරීම ද එය මැතිවරණයට සම්බන්ධ එකක් යයි කීම ද අසීරු බව ය.

කෙසේ වුව ද එජාප පක්ෂ කාර්යාලයක් ද සිද්ධිය වූ ස්ථානයේ සිට මීටර් 75 ක් පමණ දුරින් පිහිටා තිබෙන බව ද ඝාතනයට පත් තැනැත්තා කාඩ් සෙල්ලම් කිරීම සඳහා නිතිපතා එකී එජාප කාර්යාලයට යන බව ද හෙළි වී ඇති බව වාර්තාවේ සඳහන් ය. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය එජාප කාර්යාලයේ පුද්ගලයෙකු වන වෙනුර ගුණවර්ධන මහතාගෙන් මේ පිළිබඳව විමසූ විට ඔහු මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට දැනුම් දුන්නේ ඝාතනයට පත් චන්ද්‍රදාස මහතා අගෝස්තු 15 දින (ඊයේ) ප. ව. 9. 30 පමණ එහි සිට පිටත්ව ගොස් තිබෙන බව ය.

CIB 352/13 යටතේ නෙළුව පොලීසියෙහි මේ පිළිබඳව පැමිණිල්ලක් සටහන් කරනු ලැබ තිබේ. නෙළුව පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක පන්වෙල මහතා හා සම්බන්ධ වූ විට ඔහු දැනුම්

දුන්නේ මෙම සිද්ධිය මැතිවරණය හා සම්බන්ධ එකක් නොව පුද්ගලික ගැටුමක ප්‍රතිඵලයක් විය හැකි බවට සැක කරනු ලබන බවයි. කෙසේ වුව ද මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු වෙමින් තිබෙන බවත් මරණයට වගකිව යුත්තන් හඳුනා ගැනීම සඳහා වැඩිදුර විමර්ශනය පිණිස ඝාතනයට යොදා ගන්නා ලද තියුණු ආයුධය අත් අඩංගුවට ගෙන ඇති බවත් පැවසීය.

## **2015 අගෝස්තු 15 - මඩකලපු දිස්ත්‍රික්කයේ, වලච්චේනායිහි, ඔඩ්ඩමාවාඩි ඝාතනය**

2015 අගෝස්තු මස 15 වෙනි දින මධ්‍යහ්න 12. 00 පමණ මඩකලපුවේ ඔඩ්ඩමාවාඩියේ සවන හජ්ජාර් හන්දියේ දී යතුරු පැදියකින් පැමිණි පුද්ගයින් දෙදෙනෙකු විසින් එජාප ආධාරකරුවෙකු වන අමීර් මහතාට වෙඩිතබා ඝාතනය කිරීමේ සිද්ධියක් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට වාර්තා විය. වාර්තාවට අනුව ඝාතනයට ලක් වූ අමීන් මහතා මඩකලපු දිස්ත්‍රික් එජාප අපේක්ෂක අමීර් අලි මහතාගේ ප්‍රධාන ආධාරකරුවන්ගෙන් අයෙකු යයි කියනු ලැබේ.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය සමග කතා කරමින් අමීර් අලි මහතා කීවේ මෙම වෙඩි තැබීම කලින් දවසේ (2015 අගෝස්තු 14) කරන ලද පහරදීම ඉදිරියට ගෙන යාමක් ලෙස සැලකිය හැකි බවයි. ඒ සිද්ධියේ දී මුස්ලිම් කොංග්‍රසයේ ආධාරකරුවන් පිරිසක් විසින් එජාප ආධාරකරුවන්ට පහර දී තිබුණි. අමීර් අලි මහතා තවදුරටත් පැවසුවේ ඔහු මුස්ලිම් කොංග්‍රසය මෙම ඝාතනයට වගකිව යුත්තන් බව විශේෂයෙන්ම මුස්ලිම් කොංග්‍රසයේ මඩකලපු දිස්ත්‍රික් අපේක්ෂක රියාල්දීන් මහතාව සැක කරන බව ය. මෙම චෝදනාව සම්බන්ධයෙන් අමීර් අලි මහතාගේ පටිගත කරන ලද වීඩියෝවක් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත තිබේ.

සිද්ධිය සම්බන්ධයෙන් කතා කිරීමට වාලච්චේනායි පොලිස් ස්ථානාධිපතිවරයා නොසිටි අතර පොලිස් ස්ථානයේ නිලධාරියෙක් මෙම සිද්ධිය තහවුරු කළේ ය. පොලීසිය තවදුරටත් පැවසුවේ සිද්ධිය සම්බන්ධයෙන් මේ දක්වා කිසිවෙකු අත් අඩංගුවට ගෙන නොමැති බවත් විමර්ශන කර ගෙන යමින් තිබෙන බවත් ය.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය මුස්ලිම් කොංග්‍රස් අපේක්ෂක රියාල්දීන් මහතාට ඇමතු අවස්ථාවේ ඔහුට හා ඔහුගේ පක්ෂ ආධාරකරුවන්ට එල්ල කරන මෙම චෝදනා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළේ ය.

මැ.ප්‍ර.නි.ම. වර්ෂ 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංධානය එක්ව ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණයන්හි ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණයට ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට මැ.ප්‍ර.නි.ම. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ මානව හිමිකම් දත්ත කේන්ද්‍රයෙන් (INFORM) සමන්විත වේ.

මැ.ප්‍ර.නි.ම. සියලු වාර්තා සහ මාධ්‍ය නිවේදන www.cmev.org වෙතින් ලබා ගත හැකිය.



ආචාර්ය පී. සරවනමුත්තු
සම කැඳවුම්කරු